www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

### ඇමරිකානු සෙනෙට් මන්ඩලය ඉංග්‍රීසිය‍ ජාතික භාෂාව' ලෙස ප්‍රකාශයට පත් කරයි:

# ස්වෝත්තමවාදයට සහ ජාතිවාදයට තල්ලුවක්

## US Senate declares English the "national language": a boost to chauvinism and racism

**සමාජවාදී සමානතා පක්ෂයේ ප්‍රකාශය**

**2006 මැයි 20**

සෙනෙට් සභාව විසින් පසු ගිය බ්‍රහස්පතින්දා ඉංග්‍රීසි භාෂාව ඇමරිකාවේ 'ජාතික භාෂාව' ලෙස සම්මත කිරීම සමාජවාදී සමානතා පක්ෂය පැහැදිලි ලෙස ම හෙලා දකී. සෙනෙට් සභාවේ සංක්‍රමන 'ප්‍රතිසංස්කරන' පනතට එකතු වූ මෙම පියවර බුෂ් පරිපාලනයේ හා රිපබ්ලිකන් පක්ෂයේ දක්ෂිනාංශික පදනමට මුක්කු ගැසීම අරමුනු කර ගෙන ගනු ලැබූ ප්‍රතිගාමී, මුග්ධ සහ අදූරදර්ශී පියවර මාලාවක, ඉතාම දුරදිග යන සහ ප්‍රජාතන්ත්‍ර විරෝධී ඇඟවුම් සහිත නවතම පියවර යි.

මෙම යෝජනාව සංක්‍රමනිකයකන්ට එරෙහිව පොදුවේ ද හිස්පැනික් (ස්පාඤ්ඤ බස කතා කරන - පරිවර්තක) ඇමරිකානුවන්ට එරෙහිව විශේෂිතව ද, නොරිස්සීම හා ක්‍රෝධය ඇවිලවීමට කටයුතු කරන දක්ෂිනාංශික හා ෆැසිස්ට්වාදී කොටස්වලට දෙන ලද පිදේනියකි. "දේශ සීමාව ආරක්ෂා කිරීමේ" නාමයෙන් නීති ගත කරන ලද සියලු ම පියවරයන්ගේ ප්‍රජාතන්ත්‍ර විරෝධී සහ ව්‍යවස්ථා විරෝධී සාරය මෙයින් අවධාරනය වේ.

ෆෙඩරල් ආන්ඩුව මගින් ඉංග්‍රීසිය මෙවැනි නිල ඔසවා තැබීමකින් තොරව ඇමරිකා එක්සත් ජනපදයවසර 200කට වැඩි කලක් පැවතුනේ ය. ආදි කතුවරුන් විසින් එවන් විධානයක් ඇමරිකානු ව්‍යවස්ථාවේ ලියා නැත. 1780 දී ඉංග්‍රීසිය වෙනුවෙන් කැප වුන නිල ශාස්ත්‍රාලයක් පිහිටුවීමට ජෝන් ඇඩම්ස් කල යෝජනාවක් ප්‍රජාතන්ත්‍ර විරෝධී යැයි පවසමින් එකල ප්‍රතික්ෂේප කරනු ලැබී ය.

විසි වන සියවස ඇරඹුමේ දී සිදු වූ මහා සංක්‍රමනයේ උච්ච අවස්ථාවේ නැගෙනහිර හා දකුනු යුරෝපයෙන් දුසිම් ගනනේ විදේශ භාෂා වහරන දසලක්ෂ ගනන් ජනයා ඇමරිකාවට ගලා ආ විට පවා ඇමරිකාවේ පාලක ප්‍රභූවට මේ ආකාරයේ වෙනස් ලෙස සැලකීමේ හා ඡන්ද බලය අහිමි කිරීමේ නීතිවල අවශ්‍යතාව හැඟී ගියේ නැත. දැන් මේ මොක ද?

පිලිතුර රඳා පැවතිය හැකි වනුයේ ඇමරිකානු ධනපති සමාජයේ ගැඹුරු අර්බුදය සහ පරිහානිය, ඇමරිකානු සමාජය පුලුල් මහජනතාවක් මූල්‍ය කතිපයාධිකාරයෙන් බෙදා වෙන් කෙරුනු සමාජ අසමානතාවේ අතිදැවැන්ත වර්ධනය සහ වැඩි වැඩියෙන් අපකීර්තියට පත් වන පාලක ප්‍රභූවක් සිය පාලනයට මුක්කු ගසා තැබීමට ප්‍රතිගාමිත්වයට ආයාචනා කිරීමේත් පොලිස් රාජ්‍යයක් දෙසට ගමන් කිරීමේත් ප්‍රයත්නය තුල පමනකි. ඇමරිකානු ආර්ථික හා දේශපාලන පද්ධතියට ඇමරිකාවේ බහුවිධ ජනතාව ඒකාග්‍ර කර ගැනීමටත් ඔවුන්ගේ මූලික අවශ්‍යතා සැපිරීමටත් නොහැකි ය.

එක් කෙනෙකු හැර අන් සියලු රිපබ්ලිකන් සෙනෙට් සභිකයන්ගේ සහය ඇතිව විධානය ඡන්ද 63 ට 24 ක් ලෙස සම්මත විය. ඩිමොක්‍රැටිකයෝ නව දෙනෙක් යෝජනාවට පක්ෂව ඡන්දය දුන්හ. මින් "ඇමරිකා එක්සත් ජනපදයේ ජාතික භාෂාව ලෙස ඉංග්‍රිසියේ කාර්යය ආරක්ෂා කිරීමටත් ඉහල දැමීමටත්" නියෝග කෙරේ. ඉන් තව දුරටත් කිසිවෙකුටත් "එක්සත් ජනපද ආන්ඩුව හෝ එහි කවර හෝ නිලධරයකු හෝ නියෝජිතයකු හෝ ඉංග්‍රීසි හැර වෙන යම් භාෂාවකින් ක්‍රියා කිරීම, සන්නිවේදනය කිරීම, සේවාවන් ඉටු කිරීම හෝ සැපයීම ඉල්ලීමට අයිතියක්, බලයක් හෝ අයිතිවාසිකමක්" නැත්තේ ය.යනුවෙව් ප්‍රකාශයට පත් කරයි.

මේ වනාහි, ජනගහනයෙන් සියයට 16ක් වූ,එනම් කෝටි 4.7ක් ජනයා සිය නිවසේ දී ඉංග්‍රීසි නොවන වෙනත් භාෂාවකින් කතා කරන රටකි. සෙනෙට් විධානය පලමුව හා ප්‍රධාන කොට ම එල්ල කරනු ලැබුවේ රටේ ජනගහනයෙන් සියයට 13.4ක් වන්නා වූ ද වාර්ගික අංශයෙන් වේගයෙන් ම වර්ධනය වන කොටස වන්නා වූ ද කොටි 3.5ක් වන හිස්පැනික් ඇමරිකානුවන්ට විරුද්ධව ය. ලෝකයේ ස්පාඤ්ඤ භාෂාව කතා කරන ජනයා වසන රටවලින් පස් ව ස්ථානය වන්නේ ඇමරිකාව ය. එහෙත් මෙම පියවර හයිටියානු-ඇමරිකානුවන් සහ වෙනත් බොහෝ ජාතික හා වාර්ගික කන්ඩායම් මත ද ව්‍යසනකාරී බලපෑමක් ඇති කරනු ඇත.

එහි නියෝග අතර ඇමරිකාවේ නේවාසිකත්වය සඳහා අයදුම් කරන විදේශිකයන් සඳහා ඉංග්‍රීසි ප්‍රවීනතා පරීක්ෂනයක් ද වෙයි. දැනට එවන් පරීක්ෂනයක් අවශ්‍ය වනුයේ පුරවැසි භාවය ඉල්ලන අය සඳහා පමනි. පුරවැසි භාවය ලබා ගැනීමේ දී ඉංග්‍රීසි ප්‍රවීනතා අවශ්‍යතාවට අමතරව ඇමරිකානු ඉතිහාසය හා ආන්ඩුව පිලිබඳ වූ දැනුමක අවශ්‍යතාව ද සැපිරිය යුතු බැවින් අයදුම්කරුවන්ට වඩාත් ආයාසකර වනු ඇත.

ධවල මන්දිරයේ දැනට ලැග සිටින්නා ද ඇතුලුව, එවන් ප්‍රමිතියක් විදහා දැක්වීම දුෂ්කර වන්නා වූ ප්‍රමුඛ පෙලේ ඇමරිකානු සංගත නායකයන් සහ දේශපාලනඥයන් සිටින්නේ සුලුපටු පිරිසක් නො වේ.

ඇමරිකාවේ නිල භාෂාව ලෙස නම් කිරීමෙන් මෙහා විධානය අවසන් වන නමුදු එය බහු භාෂා සේවාවන් හා ආන්ඩුවේ සන්නිවේදන තහනම් කෙරෙන දිශාවට වන ප්‍රධාන පියවරකි. මෙයින් ඡන්ද පත්‍රිකා හා හදිසි අවස්ථා උපදේශ ඇතුලු අනෙක් භාෂාවලින් ද්‍රව්‍යයන් හා සේවා සැපයීම සඳහා වන ආන්ඩුවේ වගකීම තහවුරු කෙරෙන වර්තමාන නීති වෙනස් නොවන නමුත් කොන්ග්‍රස් පනත්වලින් අනුමැතිය නොලද විධායක නියෝග, රෙගුලාසි, සිවිල් සේවා මග පෙන්වීම් සහ අනෙකුත් බහුභාෂා ආඥා පනත් නිෂේධනය කර දැමීමට භාවිතා කල හැකි ය.

සංක්‍රමනික-හිතවාදී කන්ඩායම් පෙන්වා දෙන්නේ මෙම විධානයෙන් ෆෙඩරල් ඒජන්සි ගනනාවක බහුභාෂා සේවාවන් හා සන්නිවේදනයන් අනිවාර්ය කරමින් ක්ලින්ටන් පරිපාලනය යටතේ පැනවූ විධායක නියෝග අවලංගු වී යනු ඇති බව සහ බහුභාෂා සේවාවන් වෙනුනේ වන උසාවි නියෝග සහ ප්‍රාදේශීය ආඥා පනත්වලට වල කැපී යා හැකි බව ය.

සියල්ලටමත් වඩා සෙනෙට් විධානය මේ හා සමාන වූ වෙනස්කම් කිරීමේ ප්‍රතිපත්ති නීති ගත කිරීම සඳහා ප්‍රාන්ත හා ප්‍රාදේශීය අධිකාරීන් දිරි ගැන්වීමක් වන්නේ ය.දැනට මත් ඇමරිකාවේ ප්‍රාන්ත 27ක් ඉංග්‍රීසිය සිය නිල භාෂාව ලෙස ප්‍රකාශයට පත් කරමින් නීති පනවා ගෙන තිබේ.

විධානයේ ඇඟවීම් අතිවිශාල ය. ඉංග්‍රීසි වහරන්නේ නැති ඇමරිකානුවන්ට රෝහල් නිලධාරින් සමග සන්නිවේදනයේ යෙදීමට නොහැකි වනු ඇත, තීරනාත්මක ලියකියවිලි ගොන්නක් ම කියවීමට නොහැකි වනු ඇත, ඔවුන්ගේ එදිනෙදා ජීවිතයේ අතිමූලික ක්‍රියාවන් ඉටුකර ගැනීමේ දී මැඩගත නොහැකි බාධකයන්ට මුහුන දීමට සිදු වනු ඇත. ඡන්දය සඳහා ලියාපදිංචි වීම වැනි මූලික ප්‍රජාතන්ත්‍රීය අයිතීන් භුක්ති විඳීම සඳහා වන ඔවුන්ගේ ප්‍රයත්නයන් නිෂ්ඵල විය හැකි ය.

සංස්කෘතියට හා කලාවට ප්‍රවිෂ්ට වීම පසෙක තිබියෙවා, යහපත් රැකියාවක් සඳහා අවශ්‍ය වන මූලික ශිල්පීය ඥානය සහ පුහුනුව ලබා ගැනීමෙන් දසලක්ෂ ගනන් වන හිස්පැනික් හා අනෙකුත් සංක්‍රමනික තරුනයන් වලක්වා ලමින් විධානය බහුභාෂා අධ්‍යාපනය මත තව දුරටත් ප්‍රහාර එල්ල කිරීම ප්‍රවර්ධනය කරනු ඇත.

මෙම යෝජනාව දැවැන්ත සමාජ හා සංස්කෘතික පල්ලම් බැසීමක ප්‍රකාශනයක් ය යන්න ඉංග්‍රීසි වහරන ඇමරිකානුවන් අතර භාෂා ප්‍රවීනත්වයේ විස්මිත පහල වැටීම මගින් අවධාරනය කෙරෙයි. ඉංග්‍රීසි භාෂාව රැක බලා ගෙන පෝෂනය කරන්නේ යැයි කියා ගන්නා පාලක ප්‍රභූවේ දේශපාලන නියෝජිතයන් ම සාමාන්‍ය ජනගහනයේ අසරනතාව ව්‍යසනකාරීව ඉහල නගිනු නො දැක්කා සේ හිඳ ඇත. 1998නිකුත් කල ආන්ඩුවේ වාර්තාවකට අනුව සෑම දෙදෙනකුගෙන් ම එක් අයකුට ආසන්න වන කෝටි 9කට වැඩි ඇමරිකානු වැඩිහිටියන් නූතන සමාජයට අවශ්‍ය අවම කුසලතා නොමැතිව ක්‍රියාකාරිත්වයෙන් අසාක්ෂර ය. නැත හොත් ආසන්නව අසාක්ෂර ය.

කෝටි 19.1ක් ඇමරිකානු වැඩිහිටියන්ගෙන් කෝටි 4.4කට පුවත්පතක් කියවීමට හෝ රැකියා ඉල්ලුම් පතක් පිරවීමට හෝ නොහැකි බව අධ්‍යනය වාර්තා කලේ ය. තවත් කෝටි 5කට අටවන ශ්‍රේනියේ මට්ටමට ඉහලින් කියවීමට හෝ අවබෝධ කර ගැනීමට නොහැකි ය. එලඹුන වසරවල දී තත්වයන් වර්ධනය වූයේ යැයි විශ්වාස කිරීමට හේතුවක් නොමැත.

අසාක්ෂරතාවේ වසංගතයක් ඇති කරමින් පාසල් අරමුදල් හිඟකමේ තබන, කලා, සංගීත හෝ සංස්කෘතියේ අනෙකුත් රූපාකාරයන්ටසම්පත් සම්පාදනය ප්‍රතික්ෂේප කරන පාලක ප්‍රභූවක් ඉංග්‍රීසි නොවහරන ඇමරිකානුවන්ට 'ජාතික භාෂාවේ' ප්‍රවීනත්වය ලැබීමට අවශ්‍ය වන දැවැන්ත සම්පත් සම්පාදනය කර දීම විය හැකි දෙයක් ද? පිලිතුර පැහැදිලි ය.

කුමන තත්වයක දී වුව ද ඉංග්‍රීසිය වරප්‍රසාදිත තත්වයකට නිල වසයෙන් ඔසවා තැබීම නිසැකයෙන් ම ප්‍රජාතන්ත්‍ර විරෝධී පියවරකි. එය වෙනස්කම් කිරීමක් හා බැහැර කර තැබීමක් ය. එහි ප්‍රතිගාමී පොරය සංක්‍රමනික පනතේ සංශෝධනයට සහාය දුන් සෙනෙට් සභිකයන්ගේ සඳහන් කිරීම්වලින් පිලිබිඹු වේ.

ටෙනසී රිපබ්ලිකානු සෙනෙට් සභික ලැමාර් ඇලෙක්සැන්ඩර්, එක්සත් ජනපදය "පොදු මූලධර්ම අතලොස්සක් හා අපගේ ජාතික පොදු භාෂාව මත පදනම් වූ දුර්වල කල්පිතයකි" යැයි ප්‍රකාශ කලේ ය. " අපගේ පොදු ජාතික භාෂාව" පිලිබඳව ඔහුගේ යාතිකාව ඇමරිකානු ව්‍යවස්ථාවේ ජීවය හා ලියමන යන දෙක ම හා නොගැලපෙන අමු නිර්මිතයකි.

දකුනු කැරොලිනාවේ රිපබ්ලිකන් සෙනෙට් සභික ලින්ඩ්සේ ග්‍රෙහැම් යෝජනාව පිටුපස වූ වර්ගවාදී හා හිස්පැනික් විරෝධී චේතනාවන් හඬ තැලීමේ දී වඩාත් විවෘත වී ය. ලියකියවිලි නොමැති කම්කරුවන් සඳහා සාධාරන හා මානුෂීය පිලිවෙතක් ඉල්ලමින් පැන නගින දසලක්ෂ ගනන් හිස්පැනික් සංක්‍රමනිකයන්ගේ මෑත පෙලපාලි උපුටා දක්වමින් ඔහු "අපගේ පොදු භාෂාව බලවත් කිරීමේ" අවශ්‍යතාවය ගැන කතා කලේ, " මෙය පැවසීම හොඳ දෙයක් වන්නේ පෙලපාලිකරුවන් වීදිවලට බැස මෙක්සිකානු ධජ ලෙලවන විට අප සමහරෙකුට ඊට ප්‍රතිචාර දැක්වීමට සිදු වන බැවිනි" යැයි ද ඊට ඈඳමිනි.

දේශපාලන යෝග්‍යතාවේ ඉතා මත් ම අදූරදර්ශී ගනන් බැලීම්වලින් අනුබලය ලද ඇමරිකානු-මෙක්සිකානු  දේශ සීමාව මිලිටරිගත කිරීමට වන ජනාධිපති බුෂ් ගේ යෝජනාවන් ද සමග එක් ව ගත් කල ඉංග්‍රීසිය ජාතික භාෂාව ලෙස නිල ගැන්වීම එයට අනුග්‍රහ දක් වූ දක්ෂිනාංශිකයන් කල්පනාවට භාජන නොකල තරම් වන දවැන්ත සහ අවසානයෙ ඛේදනීය වන ප්‍රතිඵලඇති කරයි. ඇමරිකානු ස්වෝත්තමවාදයට සහ ස්වදේශිකවාදයට කරන මෙම ඇමතුම, විවිධ වාර්ගික කන්ඩායම් අතර විවෘත ඝට්ටනයට හා ප්‍රචන්ඩත්වයට අවසානයේ දී මග පාදන ක්‍රියා දාමයක් අරඹමින් ජාතික හා වාර්ගික ආතතීන් උත්සන්න කිරීම පමනක් ඉටු කරයි.

අද යුරෝපය පුරා ප්‍රතිගාමී ආන්ඩු පෝසතුන් හා දුප්පතුන් අතර පලල් වන අගාධයෙන් සිය ජනතාව වෙනතකට යොමු කරවීම සඳහා ද පෙර නුවූ විරූ මර්දනකාරී පියවරයන් යුක්ති යුක්ත කරනු සඳහා ද භාෂාමය, ආගමික හා සංස්කෘතික වෙනස්කම් අවුලුවමින් සිටිති. කෙසේ සැලකුවත් එහි ඇඟවුම් යුරෝපයට වඩා බොහෝ පුපුරන සුලු රටක දූන් ඇමරිකානු පාලක ප්‍රභුව එම ගමන් පිලිවතට ම පිලිපන්ව සිටී.

පසු ගිය සඳුදා ජාතිකව රූපවාහිනියෙන් පෙන්වූ සිය කතාවේ දී බුෂ් විසින් නිවේදනය කෙරුනු විෂසෝර සංක්‍රමනික විරෝධී ප්‍රතිපත්තියට සේ ම සෙනෙට් සභාවේ ඉංග්‍රීසි භාෂා විධානයට ද ඩිමොක්‍රැටික් ප්‍රතිචාරය වූයේ අනුගත වීමක් සහ යටත් වීමක් ය. මූලධර්මාත්මක පදනමක රිපබ්ලිකන් විධානයට විරුද්ධ වීමට අකැමතිව ඩිමොක්‍රැටිකයෝ ඉංග්‍රීසිය රටේ "පොදු හා ඒකාබද්ධ කිරීමේ"භාෂාව ලෙස ප්‍රකාශ කරමින් සංක්‍රමනික පනතට තමන්ගේ ම සංශෝධනයන් ගෙන ආවේ ය. ඩිමොක්‍රැටික් අනුග්‍රහය ලද විධානය ද්විභාෂා ආන්ඩු සේවාවන්ගේ "පවත්නා අයිතීන්" කපා නොහැරිය යුතු ය යන්න පමනක් විශේෂිතව ගැනීම මගින්, අඩු ම තරමින්, ද්විභාෂා අයිතීන්ගේ කවර හෝ පුලුල් වීමකට විරුද්ධ වීමේ එකඟතාවක් ඇඟවී ය.

රිපබ්ලිකන් විධානයේ මේ සැර බාල කල අනුවාදය ද 58ට 39කින් සම්මත විය. ඕනෑ ම අවසාන සංක්‍රමනික පනතක, නියෝජිත මන්ත්‍රී මන්ඩලය සමග කරන සාකච්ඡාවෙන් මතු වන්නා වූ තරගකාරී ඉංග්‍රීසි භාෂා සංශෝධනයන් දෙකෙන් එකක් පමනක් ඇතුලු කරන බව සෙනෙට් නායකයෝ ප්‍රකාශ කලහ.

ලේඛන රහිත කම්කරුවන් බරපතල අපරාධකරුවන් බවට පත් කර වෛද්‍යවරුන්, ගුරුවරුන් සහ පල්ලියේ නිලධාරීන් ඇතුලු එවන් "අපරාධකරුවන්" තබා ගන්නා හෝ ඔවුනට ආධාර කරන්නා වූ ඕනෑ ම අයකු සාපරාධී ක්‍රියා පිලිබඳ නඩු පැවරීමකට යටත් කරන්නාවූ පනතක් එම මන්ඩලය විසින් පස් ගිය දෙසැම්බරයේ දී සම්මත කර ගන්නා ලදී. රිපබ්ලිකානු මන්ඩලයේ පාලනය දරන ප්‍රතිගාමීන් විසින් ඉංග්‍රීසි භාෂා විධානයේ කුමන අනුවාදය ට සහයෝගය දෙනු ලැබේ ද යන්න පිලිබඳව ඇත්තේ සුලු සැකයකි.

භාෂාවේ පදනම මත වන සියලු ආකාරයේ වෙනස්කම් කිරීම්වලට විරුද්ධ වීම අතිමූලික ප්‍රජාතන්ත්‍රවාදී මූලධර්මයකි. එය තහවුරු කල යුතු ය. එහෙත් අන් සියලු මූලික අයිතීන් කතා කිරීමේ හා දේශපාලන අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස, නියමිත නඩු විභාගයකට ඇති අයිතිය, පුද්ගලිකත්වයට ඇති අයිතිය, ඡන්දයට හා දේශපාලන නිලවලට තරග කිරීමට ඇති අයිතිය සේ මමෙය ද ඒකාධිපති පාලනයක් දෙසට වන ඇමරිකානු පාලක ප්‍රභුවේ වෑයමට විරුද්ධව ඩිමොක්‍රැටික් පක්ෂය හරහා ආරක්ෂා කල නොහැකි ය. ඇමරිකානු මහ ව්‍යාපාරිකයන්ගේ පක්ෂ දෙක ම ප්‍රජාතන්ත්‍රීය අයිතීන්ට පහර දීමේ  දී එකඟතාව පලකරයි, මක් නිසා ද යත්, මෙම ප්‍රහාරය ඒ දෙපාර්ශ්වය ම ආරක්ෂා කරන ධනපති පද්ධතියේ අර්බුදයට වන ප්‍රතිචාරයක් බැවිනි.

කම්කරු පන්තියට පමනක් ද්විපක්ෂ ක්‍රමයෙන් බිඳී වෙන් වී ගෝලීය ධනවාදයට විරුද්ධව සටන් කිරීමට සහ සමාජවාදී සමාජයක් ස්ථාපිත කිරීමට ජාත්‍යන්තරව කම්කරු ජනයාගේ එක්සත් බව මත පදනම්ව ස්වාධීන දේශපාලන ව්‍යාපාරයක් ගොඩ නගමින්, ලේඛන ඇති හා නැති සංක්‍රමනික කම්කරුවන් එක ලෙස සලකා ඔවුන්ගේ අයිතීන් සේ ම, අනෙකුත් මූලික අයිතීන් ද ආරක්ෂා කර දිය හැකි ය. සමාජවාදී සමානතා පක්ෂය ද ලෝක සමාජවාදී වෙබ් අඩවිය ද සටන් වදින ක්‍රියා මාර්ගය මෙය යි.

© www.wsws.org